*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2017 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,033 - 2017 අගෝස්තු මස 18 වැනි සිකුරාදා - 2017.08.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1580 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1584 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1588 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1590 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1596 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1598 |


*සැ. යු.* - සුකියෝ මහිකරි ශ්‍රී ලංකා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 සැප්තැම්බර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහාධිකරණය, බදුල්ල

### රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මහියංගන දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් රථ වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. :

1. ටෙන්ඩර් පෝරමපත් නිකුත් කිරීම : 2017.09.04 සිට 2017.09.18 දක්වා
2. ටෙන්ඩර් මිලගණන්පත් භාර ගැනීම : 2017.10.03 ප.ව. 2.00 දක්වා
3. ටෙන්ඩර්පත් විවෘත කිරීම 2017.10.03 දින ප.ව. 2.30 ට බදුල්ල, මහාධිකරණ කාර්යාලයේ දී පැවැත්වේ.

02. ටෙන්ඩර් අයදුම්පත් එවිය යුතු ලිපිනය : "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ඌව පළාත්බද මහාධිකරණය, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් 2017.10.03 දිනට පෙර එවිය යුතු අතර, ටෙන්ඩර් අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල වාහන අංකය සමග "වාහන සඳහා මිල ගණන්පත් ඉදිරිපත් කිරීම" යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.

03. ටෙන්ඩර් පෝරමපත් බදුල්ල මහාධිකරණ කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් මගින් විකිණීමට යෝජිත වාහනයේ විස්තර හා ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීය යුතු ආකාරය පහත දැක්වේ. :-

| | වාහන වර්ගය හා විස්තරය | වාහන අංකය | අවම ලංසු මුදල | ටෙන්ඩර් ඇප තැන්පත් | |
|---|---|---|---|---|---|
| | | | | ආපසු නොගෙවන මුදල | ආපසු ගෙවන මුදල |
| 01. | වර්ගය : TATA වර්ගයේ මෝටර් ලොරි<br>Fuel - Diesel | 227-1305 | රු.300,000.00 | රු.100.00 | රු.5,000.00 |
| 02. | වර්ගය : BAJAJ වර්ගයේ Motor Tricycle<br>Fuel - Petrol | YX-8403 | රු.150,000.00 | රු.100.00 | රු.2,000.00 |
| 03. | වර්ගය : BAJAJ වර්ගයේ Motor Tricycle<br>Fuel - Petrol | BDK-0338 | රු.60,000.00 | රු.100.00 | රු.1,000.00 |
| 04. | වර්ගය : BAJAJ වර්ගයේ Motor Tricycle<br>Fuel - Petrol | AAB-8180 | රු.250,000.00 | රු.100.00 | රු.5,000.00 |
| 05. | වර්ගය : POTON වර්ගයේ මෝටර් ලොරි<br>Fuel - Diesel | PP-4701 | රු.200,000.00 | රු.100.00 | රු.2,000.00 |
| 06. | වර්ගය : BAJAJ වර්ගයේ Motor Tricycle<br>Fuel - Petrol | GI-1170 | රු.60,000.00 | රු.100.00 | රු.1,000.00 |
| 07. | වර්ගය : BAJAJ වර්ගයේ Motor Tricycle<br>Fuel - Petrol | QG-7089 | රු.140,000.00 | රු.100.00 | රු.2,000.00 |

04. වාහනය පරීක්ෂා කිරීම මහියංගන දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත මහියංගන දිසා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී, 2017.09.19 සිට 2017.10.02 දින දක්වා කාලය තුළ පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා කාර්යාල වේලාවන්හී දී සිදුකළ හැකි ය.

05. ජයග්‍රහණය කරනු ලබන ලංසුකරු වෙත ඒ බව ලිඛිතව දැනුම්දෙනු ලබන අතර, එම දැන්වීම ලැබීමෙන් අනතුරුව, අදාල ලංසුකරු විසින් සතියක් ඇතුළත ගෙවිය යුතු සම්පූර්ණ මුදල අදාල අධිකරණයට මුදලින් ගෙවා, එකී වාහනය අධිකරණ භූමියෙන් ඉවත් කරගැනීමට කටයුතු කළ යුතු ය.

06. බදුල්ල මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

තුසිත දේවප්‍රිය ගුණසේකර,
මහාධිකරණ විනිසුරු,

2017 ජූලි මස 19 වැනි දින,

බදුල්ල, ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

08-573

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් යුගළ 2,030 ක් ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය - SRS/F.7446

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, පහතින් දක්වා ඇති පරිදි, ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් යුගළ 2,030ක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ප්‍රසම්පාදනය සඳහා, නිෂ්පාදකයන්/සැපයුම්කරුවන් වෙතින්, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්හට, තම ලංසු, සෘජුවම හෝ ඇටර්නි බලය පැවරූ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි, පත්කළ නියෝජිතයෙකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. ඃ

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* | *සටහන* |
|---|---|---|---|
| 1. | ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් 80/90(A)1bs | යුගළ 1,000 | නිෂ්පාදනයකොට සැපයීම (ඇදීම් යාකොට ඇත) |
| 2. | ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් 88/90(A)1bs | යුගළ 1,000 | නිෂ්පාදනයකොට සැපයීම (ඇදීම් යාකොට ඇත) |
| 3. | ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් 60 E1/90 (A)1bs | යුගළ 30 | සැලසුම්කොට, නිෂ්පාදනයකොට, සැපයීම (ඇදීම් යාකොට නොමැත) |

අයිතම 1 සිට 3 දක්වා ඇගයුම්කොට එකට ප්‍රදානය කෙරේ.

2. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 5,000.00 හෝ නිදහසේ හුවමාරු කළ හැකි විදේශ මුදල් ප්‍රමාණයකින් ගෙවීමෙන්, 2017.09.06 වන දින (ශ්‍රී ලංකා වේලාවෙන්) පස්වරු 3.00 දක්වා, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ලබාගත හැකි ලේඛන මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුවේ.

3. ලංසු භාරගැනීම 2017.09.07 වන දින (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) පස්වරු 2.00 ට අවසන් කෙරේ.

4. ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් 80/90(A)1bs හා ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් 88/90(A)1bs නිෂ්පාදනය/සැපයුම සහ ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් 60 E1/90(A) 1bs සැලසුම් කිරීම, නිෂ්පාදනය හා සැපයීම, ISO 9001 ඃ 2008 තත්ත්ව සහතිකය ලද හෝ ගැනුම්කරුහට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතීන් සහිත ආයතන මගින් කළ යුතු වේ.

5. අදාළ භාරගැනීම අවසන් කළ වහාම, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී, ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලා සිටිනු ලැබේ.

6. ලංසු මුද්‍ර තබා, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

7. දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී, ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

දුරකථන අංකය : 2438078/2436818
ෆැක්ස් අංකය : 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRF/F.7446

08-675

---

## අධිකරණ භාරයට ගන්නා ලද රාජ්‍ය සන්තක කරන ලද ත්‍රිරෝද රථය මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස කල්මුණ මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2017

කල්මුණ මහාධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද රාජ්‍ය සන්තක කරන ලද ත්‍රිරෝද රථය ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම් පත්‍ර 2017 සැප්තැම්බර් මස 07 වැනි දින ප.ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම් පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, කල්මුණේ යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. නැතහොත් කල්මුණ මහාධිකරණයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළට බහාලිය යුතු ය. ලියුම් කවරයේ වම්පස, කල්මුණ මහාධිකරණය මගින් රාජසන්තක කරන ලද වාහන සම්බන්ධ ටෙන්ඩර් යනුවෙන් සඳහන් කළ යුතු ය.

මේ සඳහා මහාධිකරණ නිල මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරිතැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති ත්‍රිරෝද රථයේ අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීමේ අවසාන දිනය වන 2017 සැප්තැම්බර් මස 07 වැනි දින ප.ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය සම්බන්ධ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

ඉල්ලුම්පත්‍ර සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100/= ක් සමග, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2017 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 11.30 ට අවසන් වනු ඇත.

| අනු. අංක | වාහනයේ විස්තර | වර්ගය | විකිණීම සඳහා ලබා දෙන ලද අංක | තැන්පත් මුදල රු. | නඩු අංකය |
|---|---|---|---|---|---|
| 01 | Motor Tri Cycle (UP QK – 0288) | Bajaj | HCK/01/2017 | 1,000.00 | HC/KAL/281/2013 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2017 සැප්තැම්බර් මස 07 වැනි දින ප.ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට මහාධිකරණ ප්‍රතිසම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහළ මිලක් සඳහන් කොට ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ට ත්‍රිරෝද රථය විකිණීමට කල්මුණේ මහාධිකරණ ප්‍රතිසම්පාදන කමිටුව අනුමැතිය ලබා දෙනු ඇත. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ කල්මුණ මහාධිකරණය විසින් සිදු කරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති ත්‍රිරෝද රථය කාර්යාල දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 2.30 දක්වා වූ කාලය තුළ කල්මුණ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත නිරීක්ෂණය කළ හැකිය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබා ගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතී නම්, එම ත්‍රිරෝද රථය විකිණීම අත්හිටුවා දැමීමට අධිකරණයට පූර්ණ බලය ඇත.

විකුණන ලද ත්‍රිරෝද රථය මුදල් ගෙවා රිසිට්පත් ලබාගත් පසු වහාම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. එමෙන්ම සියලු ගෙවීම් **මුදලින් පමණක්** සිදු කළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

නවරත්න මාරසිංහ,
මහාධිකරණ විනිසුරුතුමා,
නැගෙනහිර පළාත්බද මහාධිකරණය,
කල්මුණේ.

08-735

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනයයි **(IFB)**

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා, සීනුව සහ පහන සහිත දුම්රිය හරස් මාර්ග ආරක්ෂණ පද්ධති 200ක් සපයා, ස්ථාපිතකොට, පරීක්ෂා කොට, ක්‍රියාත්මකකොට, නඩත්තු කිරීම සඳහා ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංක : SRS/F.7410/1

01. ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර 02 හි,07 වන මහලේ, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙහි ලේකම් වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රතිසම්පදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා, සීනුව හා පහන සහිත දුම්රිය හරස් මාර්ග ආරක්ෂණ පද්ධති 200 ක් සපයා, ස්ථාපිත කොට, පරීක්ෂාකොට, ක්‍රියාත්මකකොට, නඩත්තු කිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුනතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්හට ඇටර්නි බලය පැවරූ පත්කළ නියෝජිතයකු මාර්ගයෙන් ලංසු ඉදිරිපත් කළ හැක.

02. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබා ගැනීමත්, ලංසු ලේඛන පරීක්ෂාකොට බැලීමත් පහත සඳහන් ලිපිනයේ දී සතියේ දිනවල පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ කළ හැකිය. ඃ

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් අංක : 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. සුදුසුකම් අවශ්‍යතා අතරට මේවා ද ඇතුළත් ය. ඃ
 (අ) මෙම කොන්ත්‍රාත්තුව යටතේ සපයනු ලබන භාණ්ඩ, ලංසු ලේඛන සමග නිකුත් කරනු ලබන පිරිවිතරයන්ට අනුකූලව ඉදිරිපත් කළ යුතු ය;
 (ආ) මිල ගණන් සමග, සැපයීමට අපේක්ෂිත අයිතම සඳහා සැලසුම් හා නිෂ්පාදන සඳහා වූ ISO : 9001 : 2008 සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

05. (අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ අවශ්‍යතා පරිදි, ලංසුකරු සඳහා හෝ ඔහු වෙනුවෙන් හෝ කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලබන ඒජන්තවරු, උපඒජන්තවරු, නියෝජිතවරු හෝ නම්කළ අයවලුන් ලංසු ඉදිරිපත් කිරීමට පෙර අදාළ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු ය. එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතු වේ. එවන් මුල් සහතිකයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

 (ආ) එසේම, ලංසුකරුවන්, ලංසු ඉදිරිපත් කළ වහාම සහ කොන්ත්‍රාත් ප්‍රදානය පෙර, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලංසුකරුවන් ලියාපදිංචි විය යුතු ය. පොදු කොන්ත්‍රාත් පනත යටතේ එවන් ලියාපදිංචි සහතිකයක් අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත්

නොකරනු ලබන ලංසුකරුවන්හට ප්‍රසම්පාදන ප්‍රදානය කරනු නොලැබේ.

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 100,000.00 හෝ නිදහසේ හුවමාරු කළ හැකි සමාන විදේශ මුදල් ප්‍රමාණයකින් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙත හෝ විදේශවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2017.09.13 දින (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) පස්වරු 3.00 දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

07. ලංසු, පහත සඳහන් ලිපිනය වෙත, 2017.09.14 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. :
සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ලේකම් බාරේ,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය,
07 වන මහල, සෙත්සිරිපාය, අදියර 02, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර 02 හි 07 වන මහලේ, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ, අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී, 2017.09.14 වැනි දින පස්වරු 2.00ට, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

යොමු අංකය : SRS/F.7410/1
දිනය : 2017.07.31

08-544

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2017.09.30 වැනි සෙනසුරාද දින පෙරවරු 10.00 සිට බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් පාන්නන් සිටිනම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි මෙම භාණ්ඩ, වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

03. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

04. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම මිලදී ගැනීම් සඳහා වන ගෙවීම් ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිලදී ගැනීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් අනිවාර්‍යය බව සළකන්න.

06. වාහන මිල දී ගැනීමේ දී (ට්‍රැක්ටර්/වෙනත්) ව්‍යාජ අංක සහ වාහන අංක නොමැති වාහන සම්බන්ධයෙන් නැවත ගැණුම්කරු නමින් ලියාපදිංචි කිරීමට අදාල කිසිදු ලේඛනයක් අධිකරණයෙන් නිකුත් නොකරන බවද දන්වා සිටිමි.

ආර්. එම්. එස්. නයන්ත සමරතුංග,
මහෙස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බදුල්ල.

2017 ජූලි මස 28 වැනි දින,
බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල**

***2017.09.30 වන දින ප්‍රසිද්ධ වෙන්දේසියට යෝජිත භාණ්ඩ ලැයිස්තුව***

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | AR1369/11 | 1-UPGG8240 දරන යතුරු පැදිය |
| 02 | AR1369/11 | 2-UPGJ9861 දරන යතුරු පැදිය |
| 03 | AR1966/16 | 158-2220 දරන යතුරු පැදිය |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 04 | AR1228/16 | 142-9332 දරන යතුරු පැදිය |
| 05 | AR2044/15 | 157-0474 දරන යතුරු පැදිය |
| 06 | AR1680/16 | WPMJ3918 දරන යතුරු පැදිය |
| 07 | AR1431/13 | WPJJ8454 දරන යතුරු පැදිය |
| 08 | AR1627/14 | WPML4073 දරන යතුරු පැදිය |
| 09 | AR1699/15 | 121-5359 දරන යතුරු පැදිය |
| 10 | AR1699/15 | UPVD7904 දරන යතුරු පැදිය |
| 11 | AR1699/15 | අංක රහිත යතුරු පැදිය |
| 12 | AR1903/16 | UPMB9838 යතුරු පැදිය |
| 13 | 44010 | අංක 38-7373 දරන වෑන් රථය (අබලි ද්‍රව්‍ය සඳහා) |
| 14 | 1371 | අංක රහිත අත් ට්‍රැක්ටරය |
| 15 | 1626/13 | පාපැදි 01 |
| 16 | 2045/16 | පා පැදි 01 |
| 17 | 65775 | වතුර මෝටර් 01 |
| 18 | 76700 | වතුර මෝටර් 01 |
| 19 | 76700 | ටකරන් තහඩු 8, විදුලි සැපයුම් වයර් 01 |
| 20 | 81914 | අධි ශීතකරණ 01 |
| 21 | 81914 | පිහිය 1, සාස්පාන් 1 |
| 22 | 6926 | යකඩ බාල්දි 01 |
| 23 | 3288 | යකඩ බාල්දි 03, සවල් 01 |
| 24 | 2993 | සවල් 01, යකඩ බාල්දි 02 |
| 25 | 2992 | සවල් 01, යකඩ බාල්දි 01 |
| 26 | 3284 | සවල් 01, යකඩ බාල්දි 02 |
| 27 | 4069 | යකඩ බාල්දි 03 |
| 28 | 65472 | යකඩ බැරල් 01 |
| 29 | 6924 | සවල් 1 |
| 30 | 6925 | සවල් 1 |
| 31 | 91260 | බැරල් 01 |
| 32 | 92104 | සවල් 01 |
| 33 | 2260 | සවල් 01 |
| 34 | 1828 | සවල් 01 |
| 35 | 5347 | සවල් 01 |
| 36 | 4076 | සවල් 01 |
| 37 | 3640 | සවල් 01 |
| 38 | 2257 | සවල් 01 |
| 39 | 2254 | සවල් 01 |
| 40 | 2259 | සවල් 01 |
| 41 | 5589 | සවල් 01 |
| 42 | 5593 | සවල් 01 |
| 43 | 5592 | සවල් 01, යකඩ බාල්දි 01 |
| 44 | 2991 | සවල් 01 |
| 45 | 7144 | සවල් 01 |
| 46 | 371 | ජංගම දුරකථන 01 |
| 47 | 71433 | අලවංගු 01, රවුම් පිහි 02, පීරි 01, අඬු 01, බොක්ස් පැනර් 01, කුඩා ස්කුරුප්පු 01, කුඩා යතුරු 01 ඇලන් කී 1, කුඩා පෙට්ටි 01, කඳන් පොලු 01, කඳන් පිහි 01, පින්සල් 01 |
| 48 | 233 | සවල් 01 |
| 49 | 97099 | සවල් 01 |
| 50 | 1829 | සවල් 01 |
| 51 | 85615 | සවල් 01 |
| 52 | 94571 | අත් ඔරලෝසු 01 |
| 53 | 95532 | විදුලි පන්දම් |
| 54 | 90470 | අත් ඔරලෝසු 01 |
| 55 | AR23/15 | ජංගම දුරකථන 01 |
| 56 | 64749 | ජංගම දුරකථන 01 |
| 57 | 82893 | ඔරලෝසු 01 |
| 58 | 69436 | ජංගම දුරකථන 01 |
| 59 | 63884 | ජංගම දුරකථන 01 |
| 60 | 63883 | ජංගම දුරකථන 01 |
| 61 | 47773 | මහ කියත් 01 |
| 62 | 11507 | කැති 01 |
| 63 | 11506 | කැති 01 |
| 64 | 63130 | මීටර් 5 ටේප් 1, මේස පිහි 1, අඬු මිටි 01, බොක්ස් පැනර් 01 |
| 65 | 98124 | කැති 1 |
| 66 | 4066 | සවල් 2 |
| 67 | 3460 | යකඩ බාල්දි 01, සවල් 01 |
| 68 | 5952 | බැරල් |
| 69 | 75871 | බැරල් 01 |
| 70 | 69707 | බැරල් 01, රෙගියුලේටර් සහිත ගෑස් ලිප් 01, ගෑස් සිලින්ඩර් 01 |
| 71 | 99010 | බැරල් 01 |
| 72 | 83280 | බැරල් 01 |
| 73 | 88905 | බැරල් 01 |
| 74 | 97447 | බැරල් 01 |
| 75 | 93035 | බැරල් 01 |
| 76 | 82920 | බැරල් 01 |
| 77 | 62111 | යකඩ බැරල් 01, ගෑස් ලිප් 01, රෙගියුලේටර් 01සමග |
| 78 | 86640 | යකඩ බැරල් 01 |
| 79 | 68709 | යකඩ බැරල් 01 |
| 80 | 66324 | යකඩ බැරල් 01 |
| 81 | 84980 | යකඩ බැරල් 01, රෙගියුලේටර් 01 සමග, ගෑස් ලිප් 01 |
| 82 | 86619 | යකඩ බැරල් 01, රෙගියුලේටර් 01 සමග, ගෑස් ලිප් 01, ගෑස් සිලින්ඩර් 01 |
| 83 | 84758 | යකඩ බැරල් 01 |
| 84 | 5633 | යකඩ සවල් 01 |
| 85 | 4364 | යකඩ සවල් 01 |
| 86 | 66554 | අත් ඔරලෝසු 01 |
| 87 | 88751 | කැට කුඩ 01 |
| 88 | AR1679/16 | තරාදි 03 යි, තැටි 03යි |
| 89 | 1825 | ජංගම දුරකථන එක යි |
| 90 | 93220 | සවල් 01 යි |
| 91 | 62406 | යකඩ බාල්දි 01 යි |
| 92 | 14/16 | බැරල් 01 |

08-669

## මහෙස්ත්‍රාත් අධිකරණය - තඹුත්තේගම

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ 2017.09.23 වැනි දින පෙ.ව. 8.30ට තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භවීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි මෙම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් ඒ වෙලෙහිම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. ගැණුම්කරුවන් සිය පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

බී. ඒ. ඒ. අයි. බුද්ධදාස,
මහෙස්ත්‍රාත්,
තඹුත්තේගම.

2017 ජූලි මස 28 වැනි දින,
තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *ලියාපදිංචි කළ /නොකළ* | *විස්තරය* |
|---|---|---|---|
| 01 | 40457 | ලියාපදිංචි අංක රහිත | අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 02 | 39102 | ලියාපදිංචි අංක රහිත | චැසි අංක 098268, එන්ජින් අංක 098846 දරන Fammaster වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම |
| 03 | 39175 | ලියාපදිංචි අංක රහිත | SIFANG GN 12 අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 04 | 34913 | ලියාපදිංචි අංක රහිත | SIFANG අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 05 | 40199 | ලියාපදිංචි අංක රහිත | SIFANG අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 06 | 37783 | ලියාපදිංචි අංක රහිත | SIFANG වර්ගයේ සීරියල් අංක 1149, මාදිලිය එස්.195 GN අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 07 | 22469 | ලියාපදිංචි අංක රහිත | එන්ජින් අංක 02586039 (අංකය අපැහැදිලිය) දරන SIFANG අත් ට්‍රැක්ටර් එන්ජිම |
| 08 | 84529 | ලියාපදිංචි අංක රහිත | Fammaster අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 09 | 39818 | ලියාපදිංචි අංක රහිත | සීරියල් අංක 3964 SIFANG අත් ට්‍රැක්ටර් එන්ජිම |
| 10 | 36746 | ලියාපදිංචි අංක රහිත | KINGFANG අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 11 | 37851 (බී.260/16) | ලියාපදිංචි අංක රහිත | Agrotech අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 12 | 21697 | ලියාපදිංචි අංක රහිත | ට්‍රේලරය |
| 13 | ඒආර් 1262/15 | ලියාපදිංචි අංක රහිත | GARI අත් ට්‍රැක්ටරය |
| 14 | 36327 | ලියාපදිංචි අංක රහිත | SIFANG අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 15 | 24642 බී 747/14 | ලියාපදිංචි අංක රහිත | SIFANG අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |

08-596

---

## දිසා අධිකරණය - කොළඹ

### භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ප්‍රාදේශීය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ 2016.12.31 දින භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයන්ට අනුව භාවිතයෙන් ඉවත් කරන ලද සහ ඉහළ ලේඛනාගාරයේ ගලවා ඉවත් කරන ලද පහත සඳහන් අබලි භාණ්ඩ 2017.09.22 වන දින ප.ව. 2.00 සිට මෙම අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසරය ලබාගෙන මෙම භාණ්ඩ මෙදින ප.ව. 1.00 සිට ප.ව. 1.45 දක්වා පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවලදී එම භාණ්ඩ ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුවේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදීම මුදල් ගෙවා ඉවත් කරගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු වේ.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන තැනැත්තන් අනිවාර්යයෙන්ම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

ඩබ්. පී. එස්. නිශ්ශංක,<br>දිසා විනිසුරු,<br>කොළඹ.

*2016 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත ඉවත් කරන ලද භාණ්ඩ*

| | | | |
|---|---|---|---|
| 01. | ඡායාපිටපත් යන්ත්‍ර | - | 01 |
| 02. | යූ. පී. එස්. යන්ත්‍ර | - | 15 |
| 03. | ඇඳි සහිත ලී පුටු | - | 08 |
| 04. | ඇඳි රහිත | - | 02 |
| 05. | රූපවාහිනී යන්ත්‍ර | - | 01 |
| 06. | පරිගණක මේස | - | 05 |
| 07. | සී. පී. යූ යන්ත්‍ර | - | 10 |
| 08. | යතුරු පුවරු | - | 05 |
| 09. | මුද්‍රණ යන්ත්‍ර | - | 06 |
| 10. | හෙඩ් ෆෝන් | - | 10 |
| 11. | මවුස් | - | 15 |
| 12. | ලී රාක්ක | - | 01 |
| 13. | වානේ කබඩ් (ලාච්චු 04) | - | 02 |
| 14. | සිවිලිම් විදුලි පංකා | - | 08 |
| 15. | විදුලි නොවන කේතල් | - | 01 |
| 16. | බිත්ති ඔරලෝසු | - | 01 |

*ඉහළ ලේඛනාගාරයෙන් ගලවා ඉවත් කරන ලද භාණ්ඩ*

| *අංකය* | *අයිතමය* |
|---|---|
| 01. | ඉහළ ලේඛනාගාරයෙන් ගලවා ඉවත් කරන ලද යකඩ බට තොගයක් |
| 02. | දිරාපත්වී ඇති ප්ලයිවුඩ් ලෑලි තොගයක් |
| 03. | තරප්පු පෙළෙන් ඉවත් කරන ලද ලෑලි කිහිපයක් |

08-540

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - බලංගොඩ**

**අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම**

බලංගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2017.09.09 වන දින පෙ.ව. 09.00ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 08.30 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියළුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

දුමින්ද පී. මුදුන්කොටුව,<br>දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,<br>දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>බලංගොඩ.

2017 ජූලි මස 24 වැනි දින,<br>බලංගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*වෙන්දේසිය සඳහා නියමිතව ඇති භාණ්ඩ ලැයිස්තුව*

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | 60860 | Cenfin වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම | 01 |
| 2 | 49385 | EPJK 9744 දරන අත් ට්‍රැක්ටර් එන්ජිම හා ට්‍රේලරය | 01 |
| 3 | 42675 | අත් ට්‍රැක්ටර් එන්ජිම | 01 |
| 4 | 39780 | SGRV - 3255 ට්‍රේලරය | 01 |
| 5 | AR 1242/12 | 107 - 8251 දරන යතුරු පැදිය | 01 |
| 6 | AR 1048/13 | 142 - 0349 දරන යතුරු පැදිය | 01 |
| 7 | 37202 | SGQI 8574 දරන ත්‍රීවිල් රථය | 01 |
| 8 | 31701 | SGGO 0915 දරන ත්‍රීවිල් රථය | 01 |
| 9 | 59768 | අධි ශීතකරණය | 01 |
| 10 | 56874 | සිසිල් වර්ගයේ දොර දෙකේ ශීතකරණය | 01 |
| 11 | 63193 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප හා ලිප තැබීම උපයෝගී කර ගන්නා රාමුව | 01 |
| 12 | 63193 | ලිට්‍රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් | 01 |

*2016 භාණ්ඩ සමීක්ෂණයට අදල කාර්යාලීය භාණ්ඩ :*

| | | |
|---|---|---|
| 1. | අබලන් වූ අනු පිටපත් යන්ත්‍ර | 01 |
| 2. | ඡායා පිටපත් යන්ත්‍ර අබලන් වූ | 01 |
| 3. | ප්‍රින්ටර් අංක 3320 - අබලන් වූ | 01 |
| 4. | අබලන් වූ අංක (659595 - ෆැසිස්ට්) වර්ගයේ සිංහල යතුරුලියන | 01 |
| 5. | ඇඳි රහිත බංකු කැබලි සහිත | 09 |
| 6. | සාමාන්‍ය පුටු කැබලි සහිත | 19 |
| 7. | ඇඳි සහිත පුටු කැබලි සහිත | 17 |
| 8. | ඇඳි සහිත බංකු කැබලි සහිත | 02 |

08-541

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**2018 වර්ෂය සඳහා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලට ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද, රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2017.09.08 වැනි දින පෙ. ව. 10.30 දක්වා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකින් ලබාගත් කුවිතාන්සියක් ද ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන, රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සමග කවරයක බහා එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැළැස්විය හැක. නියමිත ආකෘතිපත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකිය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2017 සැප්තැම්බර් මස 08 වැනි දින පෙ. ව. 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන දින ප. ව. 2.00 ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා, විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. රා තැබෑරුම පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්කරුවන් විසින් මහජන විරෝධතාවයක් පැන නොනගින සුදුසු ස්ථානයක් තෝරා ගත යුතු ය. තෝරාගත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ඒ සඳහා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

08. 2017 සැප්තැම්බර් මස 08 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2017.10.27 වැනි දින පෙ. ව. 10.30ට නැවත රේන්දය විකිණීම මෙම ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය වේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ආර්. එම්. පී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2017 ජූලි මස 31 වැනි දින.

*උපලේඛනය*

**මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2018**

| *අංකය සහ නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශ* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් වසන දිනය සහ වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| කටුපිටිය අංක 01 | වැඋඩ විල්ලි හත්පත්තුව | කටුපිටිය | 1,000 | 2017.09.08 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

08-668

## උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018 වර්ෂය

2018 ජනවාරි මස 01 දා සිට 2018 දෙසැම්බර් මස 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද දැනට පවත්නා සියලු සුරාබදු කොන්දේසිවලට ද යටත්ව 2017 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.30 දක්වා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප්ගෙන් ලත් මුදල් කුවිතාන්සියක් ද ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවලට දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව කවරයක බහා එයට උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2017 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. "තනි වරප්‍රසාදය මිලදී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප. ව. 2.00 ට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2018 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2018 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත යුතු ය.

08. 2017 සැප්තැම්බර් මස 07 වැනි දින රේන්ද විකිණීමේ ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2017 ඔක්තෝබර් මස 26 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍යනම් මෙම උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

සුමුදු පී. විතානගේ,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2017 ජූලි මස 26 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

### උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2018 වර්ෂය

| නම හා අංකය | පත්තුව | තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් වසන දිනය සහ වේලාව | තැබෑරුම් විවෘත කළ යුතු වේලාව | තැබෑරුම් වැසිය යුතු වේලාව |
|---|---|---|---|---|---|---|
| උඩුබද්දාව අංක 02 | කටුගම්පල හත්පත්තුව | උඩුබද්දාව ගම තුළ | 1,000 | 2017.09.07 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

08-554

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම 2016.06.11 වැනි දින සංස්ථාගත කරන ලද බව නිවේදනය කරනු ලබයි.

සමාගමේ නම : ප්‍රීඩම් ලයිෆ් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පීවී 112374
ලිපිනය : අංක 388ඒ, ආනන්දගිරි වත්ත, කුලියාපිටිය.

සමාගම් ලේකම්.

08-558

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ටේඩ්ඒෂියා ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : එෆ්. සී. 1354
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 133, සෙසිල් ස්ට්‍රීට්, 12-03, කීක් සෙන්ග් ටවර්, සිංගප්පූරුව (069535)
ලියාපදිංචි දිනය : 2017.01.27

සමාගමේ නම : නෙළුම්යාය ෆවුන්ඩේෂන්
ලියාපදිංචි අංකය : පී. ඒ. 3336
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 136/1/1, පරණ කැස්බෑව පාර, ගන්ගොඩවිල
ලියාපදිංචි දිනය : 2017.05.17

සමාගමේ නම : ලංකා පැරඩයිස් ග්ලෝබල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 123475
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 716/5, මවුන්ටන් හෝල් වතුයාය, අම්බලන්වත්ත, ගාල්ල.
ලියාපදිංචි දිනය : 2017.06.29

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

08-569/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නම පහත පරිදි වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : පී. ආර්. එස්. කොකනට් ඔයිල් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
වෙනස් කළ පසු නාමය : ඇඹිලිපිටිය සුපර්සිටි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 75536
ලියාපදිංචි කාර්යාලය : අංක 459, රත්නපුර පාර, උදගම, ඇඹිලිපිටිය
ලියාපදිංචි දිනය : 2017.04.28
(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු).

08-569/2

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සෙන්ටෙක්ස් ෆැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 123299
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 545/1/5 ඒ, ඇරෙව්වල, පන්නිපිටිය, ශ්‍රී ලංකාව.
ලියාපදිංචි දිනය : 2017.06.21
(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු).

08-570

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සී එම් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 118826
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 2 සී, නිසරුව පාර, උඩුදුම්බර
ලියාපදිංචි දිනය : 2016.12.20
(ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු).

08-571

---

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

පිටකෝට්ටේ, එපිටමුල්ල පාර, අංක 48/65, හි පදිංචිව සිටින බාල උපාසකගේ ආනන්ද සෝමතිලක වන මම ජනතාවට මෙයින් දන්වා සිටින්නේ කොළඹ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් ජයන්ති විජේවීර මහත්මිය විසින් ලියා සහතික කළ 1991.01.12 දිනැති අංක 42 දරන කොළඹ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලේඛන ලියාපදිංචි කිරීමේ බලයලත් ලේඛනයේ 113 පිටුවේ 19 දරන පත්තිරුවේ දිනපොත් අංක 1269 සහ 1991.02.18 දිනැතිව ලියාපදිංචි කර ඇති මා විසින් මොරටුව, දහම් මාවත, අංක 99/1 හි පදිංචි වෙන්ගප්පුලි ආරච්චිගේ ගැලිසන් යන අය වෙත දී ඇති ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවය.

මෙම දැන්වීම ප්‍රචාරය වන දින සිට ඉදිරියට එකී මගේ ඇටෝර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ගණුදෙනුවකට හෝ වෙනයම් බැඳීමකට මා විසින් වගකීමක් නොදරන බව ද වැඩිදුරටත් මෙයින් දැනුම් දී සිටිමි.

බාල උපාසකගේ ආනන්ද සෝමතිලක.

08-665

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය ප්‍රකාරව කරණු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි.

සන්කෙන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධන අවකරණය

2007 අංක 7 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධනය ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලිය යටතේ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධන වටිනාකම වර්තමානයේ පවත්නා වටිනාකම වන රු. 83, 500,000 සිට රු. 37,500,000 දක්වා අවකරණය කිරීමට විශේෂ යෝජනාවක් කර ඇති බවත් එම යෝජනාව මෙම දැන්වීම පළකර දින 60 ගත වූ විට සමාගමේ කොටස්කරුවන් විසින් සම්මත කළ යුතුව ඇති බැව් මෙමගින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සන්කෙන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ජී. ඩබ්ලිව්. සෙක්‍රටරිස් ඇන්ඩ් එකවුන්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

08-671

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ටෙක්නොමෙඩික්ස් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123578
සංස්ථාගත කළ දිනය : 2017.07.03
ලිපිනය : අංක 4, ධම්මෝදය මාවත, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.

සමාගම් ලේකම්.

08-672/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ටෙක්නොමෙඩික්ස් ඉන්සයිට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123579
සංස්ථාගත කළ දිනය : 2017.07.03
ලිපිනය : අංක 4, ධම්මෝදය මාවත, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.

සමාගම් ලේකම්.

08-672/2

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පෞද්ගලික සමාගම 2016 පෙබරවාරි මස 19 වැනි ද පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : විස්ලන් ඇපරල් පෞද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 112010
ලියාපදිංචි කාර්යාලය : අංක 118/90/බී, අඹගමුව පාර, නාවලපිටිය.

සමාගම් ලේකම්.

08-673

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නාමය : තිමැක් ඉවෙන්ට්ස් ඇන්ඩ් එන්ටර්ටේන්මන්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 123909
සංස්ථාගත කළ දිනය : 2017 ජූලි මස 17 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 206, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

සමාගම් ලේකම්.

08-674

---

## දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්‍රීන් ලංකා එනර්ජි ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : P V 123028
ලියාපදිංචි කාර්යාලය : අංක 188/1, පිළියන්දල පාර, වේරහැර, බොරලැස්ගමුව.

08-679

## මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) කොටසට අනුකූලව හෝර්ටිකල්චර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015.03.11 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නම : හෝර්ටිකල්චර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104359
ලියාපදිංචි කාර්යාලය : අංක 143A, පාසල් හන්දිය, විගොඩ, බෙම්මුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

08-582

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීමයි

සමාගමේ නම : වර්චූස් කැපිටල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 123393
සංස්ථාගත කිරීමේ දිනය : 2017.06.27
ලියාපදිංචි කාර්යාලය : අංක 52/2, 1/3, ''රොස්මිඩ් මැනෝර්'' රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වැලොරෙම්ජුරිස් කෝපරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

08-586

---

## දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වන වගන්තියේ 1 වන උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් මතු දක්වෙන පරිදි සංස්ථා ගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *සමාගමේ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි දිනය* | *ලිපිනය* |
|---|---|---|---|
| 01. ඉමානි හෝල්ඩිංස් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 119642 | 2017.01.26 | අංක 120, අර්නෝල්ඩ් රත්නායක මාවත, කොළඹ 10 |
| 02. ඉනොවේටිව් මෙඩිකල් සප්ලර්ස් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 121318 | 2017.03.31 | අංක 24/2, ටිකල් පාර, කොළඹ 08 |
| 03. වර්ඩ් ටූ වර්ඩ් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 121704 | 2017.04.19 | 109/3, ෆයිෆ් පාර, කොළඹ 05 |
| 04. දයාරූප හෝල්ඩිංස් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 121823 | 2017.04.25 | 25/6, උඩුගොඩ, රුක්ගහවිල |
| 05. සේලාකා ලෙන්ඩිං (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 122847 | 2017.06.05 | 131, කොස්වත්ත පාර, නාවල, රාජගිරිය |
| 06. පී එන් ආර්. එක්ස්ප්‍රස් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 122845 | 2017.06.05 | අංක 88, 1/4, ජස්ටික් අක්බාර් මාවත, කොළඹ 02 |
| 07. අයින් ට්‍රේඩිං ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 123270 | 2017.06.20 | අංක 120,අර්නෝල්ඩ් රත්නායක මාවත, කොළඹ 10 |
| 08. හිමානි ෆුඩ්ස් (ප්‍රයිවටඩ්) ලිමිටඩ් | P V 123977 | 2017.07.18 | අංක 288/B 2,රෝයෙල් ගාර්ඩන්ස්, ශ්‍රී ජයවර්ධනපුර මාවත, කෝට්ටේ. |

08-572

---

## ඇග්රෝ-වෙට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලියාපදිංචි අංකය PV 1445

### සමාගම පරිවෘත කිරීමේ සහ සන්ධිය ඇවරකරුවන් නිදහස් කිරීමේ දැන්වීම

සමාගමේ නම : ඇග්රෝ-වෙට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 327, හැව්ලොක් පාර, කොළඹ 06.
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (සිවිල්) 30/2011/CO
සන්ධිය ඇවරකරුවන්ගේ නම් : පී.ඊ.ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්
ලිපිනය : SJMS ඇසෝසියේට්ස් බාරේ ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම, 4 වන මහල, අංක 02, (දැනට 3 වන මහල, අංක 11) කාසල පටුමග, කොළඹ 04.
සමාගම පරිවෘත කිරීමේ දිනය : 05.05.2017
සන්ධිය ඇවරකරුවන් නිදහස් කිරීමේ දිනය : 01.06.2017

08-690

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි**

සමාගමේ නම : වොන්වික් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : PV 123709

ලියාපදිංචි කළ දිනය : 2017.07.07

ලියාපදිංචි ලිපිනය : 570 C, එකමුතු මාවත, තලවතුගොඩ.

සමාගම් ලේකම්

08-704

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : සම්සුදීන් ඇන්ඩ් විලී (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පී.වී. 124232

දිනය : 2017.07.26

ලියාපදිංචි අංකය : අංක 116 බී, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

සමාගම් ලේකම් : සී. මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම

එස්. ඊ. සී/(2) 2013/311

08-699

---

**ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

කොහුවල, දුටුගැමුණු වීදියේ, අංක 153/6හි පදිංචි අධිකාරි මුදියන්සේලාගේ යුරේෂා අධිකාරී වන මා විසින් කොහුවල, දුටුගැමුණු වීදියේ, අංක 153/6 හි පදිංචි රාණි අධිකාරී යන අය වෙත ලබා දෙන ලද ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එල්. නිව්ටන් උස්වත්ත මහතා විසින් වර්ෂ 2016 ක් වූ ජනවාරි මස 05 වැනි දින ලියා සහතික කළ අංක 3132 දරන විශේෂ ඇටර්නි බලය අද (2017.08.18) පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට රාණි අධිකාරී යන අය මා නමින් සිදු කරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් මා වග නොකියන බව මෙයින් දන්වා සිටිමි.

08-708

---

**ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොටිකාවත්ත, මහබූත්ගමුව, අංක 140/23 ස්ථානයෙහි පදිංචි මුත්තලියාර් බාවා මොහිදීන් (ජාතික හැඳුනුම්පත් අංක 512864074 වී) සහ කොළඹ 09, දෙමටගොඩ, ආරාමය පාර, අංක 58 දරන ස්ථානයෙහිම පදිංචි මුත්තලියාර් ෂාහුල් හමීඩ් (ජාතික හැඳුනුම්පත් අංක 441432674 වී) වන අපි විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්.පී.ඒ. චිත්‍රාංගනී විසින් 2012 ක්වූ මැයි මස 09 වැනි දින ලියා සහතික කරන ලද අංක 684 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය කොළඹ 09, දෙමටගොඩ, ආරාමය පාරේ, අංක 58 ස්ථානයේ පදිංචි මුත්තාලියර් මොහොමඩ් යුසුෆ් (ජාතික හැඳුනුම්පත් අංක 492844721 වී) වෙත ප්‍රදානය කරන ඇටෝර්නි බලපත්‍රයේ අප විසින් ප්‍රදානය කරන ලද සෑම බලයම ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී මුත්තලියාර් මොහොමඩ් යුසුෆ් විසින් අප සඳහා සහ අප වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට අප විසින් වගකීම භාරගැනීමක් සිදු නොකරන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුත්තාලියාර් බාවා මොහීදීන් සහ

මුත්තලියාර් ෂාහුල් හමීඩ්

2017 අගෝස්තු මස 02 වැනි දින.

08-710

---

**ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොලොන්නාව, මග්ගොන, අංක 120/30 ස්ථානයෙහි පදිංචි මුත්තලියාර් යුසුෆ් (ජාතික හැඳුනුම්පත් අංක 470403195 වී) වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ඒ. චිත්‍රාංගනී විසින් 2012ක්වූ මාර්තු මස 22 වැනි දින ලියා සහතික කරන ලද අංක 679 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය කොළඹ 09, දෙමටගොඩ, ආරාමය පාරේ, අංක 58 ස්ථානයෙහි පදිංචි මුත්තලියාර් මොහමඩ් යුසුෆ් (ජාතික හැඳුනුම්පත් අංක 492844721 වී) වෙත ප්‍රදානය කරන ඇටෝර්නි බලපත්‍රයේ මා විසින් ප්‍රදානය කරන ලද සෑම බලයම ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී මුත්තලියාර් මොහමඩ් යුසුෆ් විසින් මා සඳහා සහ මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වගකීම භාරගැනීමක් සිදු නොකරන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුත්තලියාර් යුසුෆ්

2017 අගෝස්තු මස 02 වැනි දින.

08-711

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

කොලොන්නාව නාගහමුල්ල පාර, 33/3, පදිංචි සහීඩ් මොහොමඩ් සුෆියාන් වන මා විසින් මොහොමඩ් අන්වර් කයිරුන් නිසා යන අය වෙත බලය පවරමින් ප්‍රසිද්ධ නොතාරිස් මොහොමඩ් සෙරීෆ්න් මොහොමඩ් ෆාහිම් මහතා විසින් 2012.11.14 දින සහතික කළ අංක 1333 දරන ඇටෝර්නි බලපත්‍රය 2017.07.11 දින සිට අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදු කරන සියලු ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බවත් මෙයින් දැනුම් දෙමි.

සහීඩ් මොහොමඩ් සුෆියාන්

08-691

---

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ අපි විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

| | | |
|---|---|---|
| සමාගමේ කලින් නම | : | අලයිලා හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් (පීවීටී) එල්ටීඩී |
| සමාගමේ අංකය | : | පීවී 112391 |
| සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය | : | 27-2, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඉවෙලන් චතුරශ්‍රය, කොළඹ 01. |
| සමාගමේ අලුත් නම | : | සමර් සීසන් මිරිස්ස (පීවීටී) එල්ටීඩී |
| සමාගමේ නම වෙනස් වූ දිනය | : | 2017 ජූලි මස 25 වැනිදා |

සමර් සීසන් මිරිස්ස (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන් පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී සමාගම් ලේකම්වරුන්.

දිනය ඃ 2017 ජූලි මස 28 වැනිදා.

08-548

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි.

| | | |
|---|---|---|
| සමාගමේ නාමය | ඃ | වෙජිෂොප් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | ඃ | පී. වී. 122931 |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | ඃ | 1056, සුහද මාවත, කුමාරගේ වත්ත, බත්තරමුල්ල. |
| සංස්ථාගතකළ දිනය | ඃ | 2017 ජූනි මස 7 වැනි දින |

08-543

---

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කර ගැනීමයි

කොළඹ 06, වැවසෙට් පෙදෙස අංක 09 දරන ලිපිනයෙහි පදිංචි සතාසිවම්පිල්ලෙයි ශ්‍රීස්කන්දරාසා (ජා.හැ. අංක 402152583V) වන මා විසින් 2016.12.17 වැනි දින ත්‍රිකුණාමලේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පුලේන්ද්‍රන් මහතා විසින් ලියා සහතික කරන ලද මඩකලපුවේ ප්‍රාන්ථය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අංක 25 දරන ඇටෝර්නි බලපත්‍ර පොතේ 52 වැනි පිටුවේ 38 දරන පත්‍රිරුවේ 2017.01.19 දින ලියාපදිංචි වූ ත්‍රිකුණාමලය, උප්පුවේලි එහාම්පරම් වීදියේ අංක 707 දරන ලිපිනයේ පදිංචි වේලායුදම් ශ්‍රීදරන් (ජා.හැ.අංක 592340194V) මහතා වෙත පවරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍ර අද දින සිය අවලංගු හා බලරහිත ශුන්‍ය වන බවත් මා වෙනුවෙන් ඔහු විසින් කරනු ලබන ඕනෑම කටයුත්තක් සඳහා මා කිසිදු වගකීම් භාර නොගන්නා බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ජනතාවටත් දන්වා සිටිමි.

සතාසිවම්පිල්ලෙයි ශ්‍රීස්කන්දරාසා

2017 මාර්තු මස 30 වැනි දින.

08-651

---

### මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාර සකුරා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් 2012 මාර්තු 22 වැනිදා සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

| | |
|---|---|
| සමාගමේ අංකය | : PV 85083 |
| සමාගමේ නම | : සකුරා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලීය ලිපිනය | : අංක 159/1, කේසර් වීදිය, කොළඹ 11. |

අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලය.

08-617

**සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව මහජනතාව වෙත දැනුම් දීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගමේ නම 2017 ජුනි 22 වැනිදා වෙනස් කර ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමු.

සමාගමේ පැරණි නම : සවිසෙවන කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 106382
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 55, 5 වන පටුමග, නාවල.
සමාගමේ නව නාමය : සවිසෙවන ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

එස්ජේ කෝර්පරේට් ස්ර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

අංක 20/A, වල්පොල පාර, අග්ගොන, අංගොඩ.

08-652

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ඇක්වාකිඩ්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 123484
ලියාපදිංචි ලිපිනය : අංක 366/3, රෙන්දපොළ, හොරගහකන්ද පටුමග, තලංගම, උතුර කොස්වත්ත.
සංස්ථාගත කළ දිනය : 2017.06.29

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

08-649

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලදී. :-

සමාගමේ නම : කළම්බු ධූමක හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : PV 121586,
දිනය : 2017.11.04
ලිපිනය : 135/8A, විහාර මාවත, කැළණිමුල්ල.

සමාගමේ නම : පෙනස්කොප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : PV 120825,
දිනය : 2017.03.15
ලිපිනය : 12, උද්‍යාන පාර, කොළඹ 05.

සමාගම් ලේකම්වරු.

08-629

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සී බී මාර්කටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : PV 122930,
දිනය : 2017.06.07
